**අපි වෙනුවෙන් අපි අරමුදල - 2015**

**--------------------------------------------**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලිකිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------- ---**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අපි වෙනුවෙන් අපි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව රු. 188,619,663 ක් වූ සංවර්ධන වියදම් සහ රු. 2,220,044 ක් වූ මෙහෙයුම් වියදම් වෙන් වෙන්ව දක්වනු වෙනුවට තනි අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාජ තොරතුරු ඉදිරිපත්කර නිවාස දෙකක් ලබාගැනීම නිසා එහි පිරිවැය අදාල නිලධාරීන් දෙදෙනාගෙන් අයකර ගනිමින් පැවතුණ අතර 2015 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.1,472,254 ක් විය. මෙම අයවිය යුතු ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සන්නිවේදන කුළුණු ගාස්තු ආදායම රු.3,389,197 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික්ක 03 ක වැඩ නිමවූ රණවිරු නිවාස ව්‍යාපෘතිවලට අදාල රු.55,910,607 ක වියදම තහවුරු කරගැනීම සඳහා වූ වියදම් විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

සමාලෝචිත වර්ෂයේදී සන්නිවේදන සමාගමකින් ලැබිය යුතු සන්නිවේදන කුළුණු ගාස්තු ආදායම ලෙජර ගිණුම අනුව රු.67,527,418 ක් වුවද ඉදිරිපත් කළ උපලේඛනය අනුව රු.55,254,186 ක් වූයෙන් රු.12,273,232 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එයට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට පොත් අගය රු.11,366,664 ක්වූ ස්ථාවර වත්කම් හා සුළු උපකරණ සම්බන්ධව භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.104,762,495 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.68,264,236 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.173,026,731 ක වර්ධනයක් දක්නට ලැබුණි. පරිත්‍යාග වශයෙන් මහජනතාවගේ දායකත්වය සහ ආයෝජන පොලී ආදායම පිළිවෙලින් රු. 24,672,179 කින් හා රු.27,936,355 කින් අඩුවුවද ව්‍යාපෘති වියදම රු. 216,146,352 කින් පහළයාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

(අ) 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස

- සන්නද්ධ සේවාවල සාමාජිකයන් හට නිවාස ඉදිකිරීම පිණිස මූල්‍යමය සහාය ලබා දීම සඳහා යෝජනාක්‍රම ඇති කිරීම හා නිවාස පහසුකම් ලබාගැනීම සඳහා ආධාර ලබාදීම.
- සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සහ එම ණය ගෙවීම සඳහා ආධාර ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.
- සන්නද්ධ හමුදා සාමාජිකයෙකු මිය යන අවස්ථාවේදී හෝ තුවාල සිදු වන අවස්ථාවකදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම දක්වා තිබුණි.

(ආ) අරමුදල පිහිටුවා වසර 08 ක් ගතවී තිබුණද සන්නද්ධ සේවා සාමාජිකයන් විසින් මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා හා එම ණය ගෙවීම සඳහා සාමාජිකයන්ට ආධාර ලබා දීම වෙනුවෙන් විධිවිධාන සැලැස්වීම හා සන්නද්ධ හමුදා සාමාජිකයකු මිය යන අවස්ථාවේදී හෝ තුවාල සිදු වන අවස්ථාවකදී ණය ආපසු ගෙවනු ලැබීම සහතික කර ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම යන අරමුණු ඉටු කිරීමට අරමුදලේ කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි.

**4.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ සන්නිවේදන කුළුණු ගාස්තු ආදායම රු. 96,753,121 ක් වූ අතර සන්නිවේදන කුළුණු සඳහා ගිවිසුම් ප්‍රකාරව ලැබිය යුතු ගාස්තු / ආදායම් නියමිත කාලය තුල රැස්කර ගැනීම සඳහා අරමුදල විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ප්‍රමාදවීම් සඳහා සියයට 8 ක වාර්ෂික පොලී අයකරගෙන නොතිබුණි. මේ නිසා මුදල් ආයෝජනය කිරීමෙන් උපයාගත හැකිව තිබූ පොලී ආදායම අරමුදලට අහිමි වී තිබුණි.

**4.3** **ප්‍රමාද වූ ව්‍යාපෘති**

ක්‍රියාන්විතයේදී දිවිපිදූ රණවිරුවන්ගේ සමීපතම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරිවලදී ආබාධිත හා සේවයේ නියුතු රණවිරුවන් වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා දිස්ත්‍රික්ක 22 ක ඉදිකිරීමට සැලසුම් කර තිබූ මුළු නිවාස සංඛ්‍යාව 1664 ක් වූ අතර ඉන් නිවාස 281 ක් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

කඩ කාමර කුලී ඇප තැන්පත් සහ වාර්ෂික බදු කුලී වශයෙන් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබී තිබුණු රු. 2,983,665 ක මුදලක් අරමුදල විසින් රණජයපුර නිවාස සංකීර්ණය වෙනුවෙන් පවත්වාගෙන ගොස් තිබුණු ජංගම ගිණුමක තැන්පත් කර තිබුණි. මෙම මුදල අදාල ජංගම ගිණුම තුළ 2013 පෙබරවාරි සිට 2015 දෙසැම්බර් 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

--------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය අනුව අනුමත අයවැය ලේඛනයකින් තොරව අදාල මුදල් වර්ෂයේ කිසිදු වියදමක් නොදැරිය යුතු වුවත්, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 190,722,194 ක මුදලක් වියදම් කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | වර්ෂයට අදාල ආදායම් වියදම් නිවැරදිව ගිණුම්ගත නොවීම, වියදම් ප්‍රතිපූර්ණ බිල්පත් ඉදිරිපත් කිරීමේ අඩුපාඩු පැවතීම. |
| (ආ) කොන්ත්‍රාත් පරිපාලනය | නිවාස ඉදිකිරීම් ප්‍රමාදවීම නිසා නිවාසලාභීන් වෙත නිවාස ලබාදීම ප්‍රමාදවීම. |
| (ඇ) මූල්‍ය පාලනය | කාලීනව සන්නිවේදන කුළුණු ගාස්තු ලේඛන යාවත්කාලීන නොකිරීම හා අයවිය යුතු ගාස්තු අයකර නොගැනීම , අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම. |